| | | |
|---|---|---|
| මගේ අංකය | : | CFHC / HR / PF / 2026 / 553 |
| දිනය | : | 2026.03.30 |
| වෙත | : | සියළුම අංශ ප්‍රධානීන්,<br>සියළුම වරාය කළමනාකරුවන්,<br>වැඩබිම් භාර නිලධාරීන්,<br>යාත්‍රාපතීන් මගින්,<br>සියලුම සේවක මහත්ම මහත්මීන් වෙත. |
| පිටපත් | : | සම්මුඛ පරීක්ෂණ ලිපිගොනුව |
| වෙතින් | : | වැ.බ සහකාර කළමනාකාර (පරිපාලන) |
| විෂයය | : | **පුරප්පාඩුව පවතින යාන්ත්‍රික අධිකාරි හා තාක්ෂණික සහකාර (යාන්ත්‍රික /සිවිල්) හා තාක්ෂණික සහකාර (ශිත විදුලි /විදුලි) තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමට අදාල දැන්වීම සම්බන්ධයෙනි.** |

---

උක්ත කරුනට අදාල වන 2026.03.30 දිනැති අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමේ ලිපිය සියලුම සේවකයින්ව දැනුවත් කිරිම සදහා ඔබ අංශයේ /වරායේ/ වැඩබිමේ/ යාත්‍රාවේ ඇති දැන්වීම් පුවරුවේ මෙම අයදුම්පත් ප්‍රදර්ශණය කරන ලෙසත් සියලුම සේවකයින්ව දැනුවත් කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත ලියුම් කවරයක බහා එම ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සටහන් කර 2026.04.20 දිනට ප්‍රථම පරිපාලන අංශය වෙත යොමු කරන්න.

පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දිමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.

2026/03/30

වැ.බ සහකාර කළමනාකාර (පරිපාලන)

# ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

## පුරප්පාඩු.

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ දැනට පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අභ්‍යන්තරයෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධිකාරි (යාන්ත්‍රික)**

- ඇබෑර්තු සංඛ්‍යාව - 01

**සුදුසුකම් (පහත 01 හෝ 02 හෝ 03 හෝ 04 හෝ 05)**

01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා පිලිබඳ උපාධියක් ලබා තිබීම.

02. තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවන්හි (NVQ) හත් වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

03. තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවන්හි (NVQ) හය වැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

    **සහ**

    සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

04. තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවන්හි (NVQ) පහ වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

    **සහ**

    සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර දහයක (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

05. කළමණාකරන සහකාර තාක්ෂණික (MA 2-2) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය**

**JM 1 - 1 = රු. 72,650 - 10 x 1,360 - 18 x 2,040 - 122,970**

(මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

**තාක්ෂණික සහකාර ( යාන්ත්‍රික / සිවිල් )**

- ඇබෑර්තු සංඛ්‍යාව - 11

**<u>සුදුසුකම්</u>**

1 තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (N.V.Q) 5 මට්ටමට නොඅඩු වන්නා වු තාක්ෂණ විද්‍යා සිවිල් / යාන්ත්‍රික පිළිබඳ පාඨමාලාවක් සාර්ථකව හදාර සමත් වී තිබීම.

**සහ**

තාක්ෂණ විද්‍යා සිවිල් / යාන්ත්‍රික පිළිබඳව වසර 01 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

<u>වැටුප් පරිමාණය</u>

**MA 2 - 2 = රු. 50,540 - 10 x 540 - 07 x 630 - 04 x 1,080 - 20 x 1,280 - 90,270**
(මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

**තාක්ෂණික සහකාර ( ශිත විදුලි / විදුලි )**

- ඇබෑර්තු සංඛ්‍යාව - 02

**<u>සුදුසුකම්</u>**

1 තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (N.V.Q) 5 මට්ටමට නොඅඩු වන්නා වු තාක්ෂණ විද්‍යා විදුලි / ශිත විදුලි පිළිබඳ පාඨමාලාවක් සාර්ථකව හදාර සමත් වී තිබීම.

**සහ**

තාක්ෂණ විද්‍යා විදුලි / ශිත විදුලි පිළිබඳව වසර 01 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

<u>වැටුප් පරිමාණය</u>

**MA 2 - 2 = රු. 50,540 - 10 x 540 - 07 x 630 - 04 x 1,080 - 20 x 1,280 - 90,270**
(මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

**ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් 2026.04.20 දින හෝ ඊට පෙර තම අයදුම් පත් මානව සම්පත් අංශය වෙත ලැබීමට සලස්වන්න.**

සභාපති.
2026.03.30